# 2014 වර්ෂය සඳහා

# කාර්යසාධන වාර්තාව

# සහ

# වාර්ෂික ගිණුම්

# වාණිජ දෙපාර්තමේන්තුව

## 295 වන ශීර්ෂය


*4වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක.21, වොක්ෂෝල් වීදිය,*
*කොළඹ 02.*
*දුරකථන: 011- 232 9733 / 243 6114*
*ෆැක්ස්: 011 -243 0233*
*විද්‍යුත් තැපැල:: fortrade@doc.gov.lk*
*වෙබ් අඩවිය :www.doc.gov.lk*

# <u>පටුන</u>


පිටුව

| | | |
|---|---|---|
| *1.* | *හැඳින්වීම* | *03* |
| *2* | *2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය* | *04* |
| *3* | *ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව* | *05* |
| *4* | *වෙළඳ, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා* | *09* |
| *5* | *බහුපාර්ශ්වික වෙළඳ සම්බන්ධතා* | *12* |
| *6* | *කලාපීය ආර්ථික සහයෝගීතාව* | *14* |
| *7* | *වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය* | *20* |
| *8* | *ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම* | *25* |
| *9* | *කාර්ය මණ්ඩල සංචලන* | *28* |
| *10* | මූල්‍ය ප්‍රකාශය | *30* |


******************************

## 1.0 හැඳින්වීම

*දෙපාර්තමේන්තුවේ මෙහෙවර*

> ***"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ වෘත්තීය මට්ටම් දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම."***

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් පහත සාරාංශයෙන් දැක්වේ.

- අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.
- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම්ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2014 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, අන්තර්ජාතික වෙළඳපලවල් වලට පිවිසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශ දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්, සෘජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹ ප්‍රවර්ධනය මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

## 2.0 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

### 2.1 අපනයන සහ ආනයන කාර්ය සාධනය

ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2013 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 10,009ක් වූ ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඉපැයුම්, 2014 වර්ෂය තුළදී 10%ක වර්ධනයක් සනිටුහන් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 11,044 ක් දක්වා වැඩිවී ඇත. සමස්ත අපනයනයෙන් 75%ක් පමණ වන කාර්මික අපනයන මගින්, ප්‍රධාන වශයෙන් රෙදි පිළි සහ ඇඟළුම් අපනයනයන්ගේ සැලකිය යුතු වර්ධනයක් පැවතීම හේතුකොටගෙන 2014 වර්ෂයේදී අපනයන වර්ධනය සඳහා එමගින් විශාල දායකත්වයක් ලබාදී ඇත. පොල් නිෂ්පාදන, තේ සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන කිහිපයක් පෙරටුකරගත් කෘෂිකාර්මික අපනයන ඉපැයුම් 2014 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 2,794ක් දක්වා 8.2%කින් වැඩිවී ඇත.


ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2013 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 17,098ක් වූ ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම 2014 වර්ෂය තුළදී 13%ක වර්ධනයක් පෙන්නුම් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 19,246 ක් දක්වා වැඩිවී ඇත. ආනයන වියදම වැඩිවීම සඳහා ප්‍රධාන දායකත්වය ලැබී ඇත්තේ අතරමැදි භාණ්ඩ මගිනි. ඛණිජ තෙල් නිෂ්පාදන සහ රෙදි පිළි හා රෙදි පිළි අයිතමයන් ඉතා වැඩි වශයෙන් ආනයනය කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. සමස්ත ආනයනයෙන් 60%ක් පමණ වන අතරමැදි භාණ්ඩ ආනයනය සඳහා වන වියදම 2013 වර්ෂයට සාපේක්ෂව 8%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2014 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 11,398ක් විය.

**ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය**
**2009 – 2014 (වටිනාකම: ඇමෙරිකානු ඩොලර් මිලියන)**

| වර්ෂය | අපනයන | වර්ධන ප්‍රතිශතය | ආනයන | වර්ධන ප්‍රතිශතය | සමස්ත වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| 2009 | 7,118 | - 13.0 | 9,767 | - 28.0 | 16,885 | -2,648 |
| 2010 | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| 2011 | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| 2012 | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| 2013 | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |
| 2014 | 11,044 | 10.3 | 19,246 | 12.6 | 30,290 | -8,202 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව*

## විදේශ වෙළඳ ගමන් මඟ 2014




| අපනයන (%) | |
|---|---|
| යුරෝ.සං. (EU) | 31.28 |
| ඇ.එ.ජ. | 24.63 |
| මැද පෙරදිග | 9.21 |
| ඉංදියාව | 5.66 |
| රුසියාව | 2.48 |

| ආනයන (%) | |
|---|---|
| ඉන්දියාව | 20.67 |
| චීනය | 17.74 |
| මැදපෙරදිග | 12.79 |
| යුරෝ.සං. (EU) | 8.23 |
| සිංගප්පූරුව | 6.60 |

## 3.0 ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව

2014 වසරේදී, ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමඟ මෙන්ම, ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ කටයුතු සිදුකරනු ලබන අනෙකුත් රටවල් සමඟද ද්විපාර්ශ්වික වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දැඩි විමසිල්ලකින් හා අවධාරණයකින් යුතුව කටයුතු කරන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, චීනය, ඉන්දියාව, පාකිස්ථානය, ජපානය, වියට්නාමය, රුසියාව සහ පැරණි සෝවියට් සංගමයේ රටවල්, අප්‍රිකානු සහ මැද පෙරදිග කලාපය සමඟ වෙළෙඳ හා ආර්ථික සබඳතා මේ සම්බන්ධයෙන් ප්‍රධාන වී ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පාකිස්ථානය සමඟ අත්සන් තබන ලද ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ සහ චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම (FTA) යනාදිය යටතේ වාණිජමය ප්‍රතිලාභ වැඩිදියුණු කරගැනීම පිළිබඳව වැදගත්කමක් සහිතව කටයුතු කරන ලදී.

### 3.1 ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

1998 දෙසැම්බර් 28 වන දින අත්සන් තබන ලද, 2000 මාර්තු මස 01වන දින සිට ක්‍රියාත්මක ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) මගින් දෙරට අතර වෙළඳාම් වන පුළුල් නිෂ්පාදන පරාසයක් සඳහා තීරුබදුවලින් නිදහස්වීමේ සහන සැලසේ. ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2008 නොවැම්බර් මාසයේ සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මකවී ඇති අතර එමඟින්, තීරුබදු අයිතම 4000කට

අධික ප්‍රමාණයක් යටතට ගැනෙන නිෂ්පාදන තීරුබදුවලින් නිදහස් පදනම මත ඉන්දියානු වෙළඳපොළ වෙත අපනයනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත.

2013 වර්ෂයේදී වාර්තාවූ අගයන් සමඟ සැසඳීමේදී, 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරන ලද අපනයනවල වටිනාකම 15%ක වර්ධනයක් සනිටුහන් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 624.81ක් අගයක් පෙන්නුම් කරන ලද අතර ඉන්දියාවෙන් ශ්‍රී ලංකාව වෙත කරන ලද ආනයනවල වටිනාකම 29%ක වර්ධනයක් සනිටුහන් කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,977.76ක අගයක් සටහන් විය. මෙම වර්ෂයේදී දෙරට අතර සමස්ත වෙළඳාම පෙර වර්ෂය හා සැසඳීමේදී 27%ක වර්ධනයක් සහිතව ඇ.ඩො. මිලියන 4,602.57ක අගයක් වාර්තා කරන ලද අතර එය, ඇමෙරිකානු ඩොලර් මිලියන 3,352.95ක ඉන්දියාව සමඟ ශ්‍රී ලංකාවේ අහිතකර වෙළඳ ශේෂය ශක්තිමත් කිරීම සඳහා ඉවහල් වන ලදී. එම කාලපරිච්ඡේදය තුළදී ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ආනයන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 540.1ක් විය.

ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2014 වර්ෂයේදී ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ඉන්දියාව වෙත කරන ලද අපනයන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 375.8ක් ලෙස වාර්තා වන ලදී. එමෙන්ම, 2014 වර්ෂයේදී ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ ඇඟළුම් සලාකය යටතේ ඇඟළුම් අපනයනයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 20.6ක අපනයන වටිනාකමක් වාර්තා කරන ලදී.

### 3.2 පාකිස්ථාන – ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2005 ජුනි මස 12 වන දින විට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර වෙළඳාමෙහි සැළකියයුතු වර්ධනයක් වාර්තා වී ඇත. පාකිස්ථානය, සාර්ක් කලාපය තුළ ඉන්දියාවට පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරු වේ. ගම්මිරිස්, එළවළු නිෂ්පාදන, බීඩි කොළ, බුලත් කොළ, පොල්කටු කැබලි, ස්වාභාවික රබර්, පොල් සහ අමු හෝ වියලි කජු යනාදිය පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාව විසින් සිදු කරනු ලබන ප්‍රධාන අපනයනයන්ට ඇතුළත් වේ. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් අනතුරුව නව නිෂ්පාදන පෙළක්ද පාකිස්ථාන වෙළඳපළ වෙත අවතීර්ණ වී ඇත. ඇඟළුම්, එම්ඩීඑෆ් පුවරු, විස්කෝතු, නැවුම් අන්නාසි, ක්‍රීඩා භාණ්ඩ, ඇට සහිත සියඹලා, බාදා තෙල්, පෝසිලේන් පිඟන් භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ, පිඟන් ගඩොල්, ගෘහභාණ්ඩ, තීන්ත, වීදුරු පින්තාරු, සම් භාණ්ඩ, සීතකළ මාළු, ඉස්සෝ, පොකිරිස්සෝ, කකුළුවෝ, කැපූ මල් සහ විසිතුරු පත්‍ර, මැණික් හා ස්වර්ණාභරණ සහ සුරතල් මසුන් යනාදී අයිතමයන් මෙම නව නිෂ්පාදනයන්ට ඇතුළත් වේ.

2004 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 147ක් වූ දෙරට අතර මුළු වෙළඳ වටිනාකම 2014 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 353.84ක් දක්වා වැඩිවී ඇත. 2004 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 39ක් වූ පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාවේ අපනයන 2014 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 74.25ක් දක්වා වැඩිවී ඇත. එහෙත්, 2013 වර්ෂය හා සැසඳීමේදී එහි පහත වැටීමක් පෙන්නුම් කෙරේ. පාකිස්ථානය සඳහා ප්‍රමුඛතම අපනයන අයිතමය බුලත් කොළ වේ.

ශ්‍රී ලංකා රේගු දත්ත අනුව, 2014 වර්ෂයේදී පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ ශ්‍රී ලංකාව විසින් පාකිස්ථානය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 51.78ක වටිනාකමින් යුතු භාණ්ඩ අපනයනය කර ඇති අතර, පාකිස්ථානයෙන් ශ්‍රී ලංකාව වෙත කරන ලද ආනයනයන්ගේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 79.12ක් ලෙස සනිටුහන් කර ඇත.

2013 වසරේ අප්‍රේල් මාසයේදී පවත්වන ලද තාක්ෂණික මට්ටමේ 5 වැනි සභාවාරයේදී නියෝග කර ඇති පරිදි, විසඳීමට පවත්නා වෙළඳාම ආශ්‍රිත කරුණු කිහිපයක් විසඳීම සඳහා වෙළඳාම, ආයෝජනය, රේගු සහයෝගීතාව සහ මෝටර් රථ ක්ෂේත්‍රය (Auto Sector) පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමහි 1 වැනි සභාවාරය 2014 ඔක්තෝබර් 20 – 21 දිනයන්හිදී ඉස්ලාමාබාද් හිදී පවත්වන ලදී. සේවා සහ ආයෝජන ක්ෂේත්‍ර ඇතුළත් කරමින් පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) තවදුරටත් පුළුල් කිරීම සඳහා වන අවශ්‍යතාව පිළිබඳව මෙම සභාවාරයේදී අවධාරණය කරන ලදී. රේගු සහයෝගීතාව, වෙළඳ ආරවුල් විසඳීම, තීරුබදු නොවන සම්බාධක යන ක්ෂේත්‍ර සහ වෙළඳපල ප්‍රවේශ ගැටළු පිළිබඳව දෙපාර්ශ්වය විසින් මෙම සභාවාරය අතරතුරදී සාකච්ඡා කරන ලදී.

### 3.3 චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම (FTA)

2013 වර්ෂයේදී අති ගරු ජනාධිපතිතුමාගේ චීන සංචාරය අතරතුරදී, නිදහස් වෙළඳ ගිවිසුමක් (FTA) සඳහා වන යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, 2013 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ චීනයේ වාණිජ කටයුතු අමාත්‍යාංශය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මඟපෙන්වීමෙන් ශ්‍රී ලංකාව වෙනුවෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡාවල නිරත විය. ඒ අනුව, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු වෙළඳ සාකච්ඡා සම්මුති කමිටුවක් පිහිටුවන ලදී.

වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත්කරන ලද අතර, අනෙකුත් අදාල අමාත්‍යාංශවල නිලධාරීන් සහ පෞද්ගලික අංශයේ නියෝජිතයන් දෙදෙනෙකු උපදේශකවරුන් වශයෙන් මෙම කමිටුවට ඇතුළත් විය. මෙම කමිටුවේ සාකච්ඡා වට දෙකක් පවත්වා ඇති අතර 2015 ජනවාරි මාසය අවසානයේදී පැවැත්වීමට සැලසුම් කරන ලද තෙවන වටයේ සාකච්ඡාව කල් දමනු ලැබ ඇත.

චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමට භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය, රේගු සහයෝගීතාව, වෙළඳාම සඳහා තාක්ෂණික සම්බාධක, සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක නියමයන් සහ ආරක්ෂණයන්ය යන අංශයන් ඇතුලත් වේ. ඒ අනුව, චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම, විස්තීර්ණ නිදහස් වෙළඳ ගිවිසුමක් ලෙස සළකනු ලැබිය යුතුය. 2015 වර්ෂයේ මැද භාගය වන විට මෙම ගිවිසුමේ කටයුතු නිමාවට පත්කිරීම ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ අපේක්ෂාව විය.

ඒ අනුව චීනය සමඟ පළමු වටයේ සාකච්ඡා චීන ජනාධිපතිතුමාගේ සංචාරය අතරතුරදී කොළඹදී පවත්වන ලදී. දෙවන වටයේ සාකච්ඡා 2014 නොවැම්බර් මාසයේදී චීනයේ බෙයිජින් හිදී පවත්වන ලදී.

### 3.4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම, ආයෝජනය සහ ආර්ථික ගැටළු පිළිබඳ ද්විපාර්ශ්වික සාකච්ඡා

වාණිජ ලේකම් මට්ටමේ දෙවන වටයේ සාකච්ඡා 2014 ජනවාරි 23 සිට 24 දක්වා ඉන්දියාවේ නව දිල්ලි හිදී පවත්වන ලදී. එහිදී දෙරට අතර ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යුහයක් වශයෙන් නිදහස් වෙළඳ ගිවිසුමේ වැදගත්කම පිළිබඳව දෙපාර්ශ්වය විසින් නැවත නැවතත් ප්‍රකාශ කරන ලදී. ඉන්දියාව වෙත ශ්‍රී ලංකාවේ අපනයන ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ

ඉන්දියානු ආයෝජන කාර්යභාරය පිළිබඳව ඉන්දියානු පාර්ශ්වය විසින් අවධාරණය කරන ලද අතර, පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් කෙරෙහි මූලික අවධානය යොමු කරන ලදී.

- රථවාහන අමතර කොටස් නිෂ්පාදනය කිරීම
- සැහැල්ලු ඉංජිනේරු නිෂ්පාදන නිපදවීම
- ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම

නිදහස් වෙළඳ ගිවිසුම මගින් වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් පමණක් සාකච්ඡා නොකළ යුතු බවත් ආර්ථික සහයෝගීතාව පිළිබඳව සහ ඉන්දියාවෙන් හා අනෙකුත් අසල්වාසී රටවලින් ආනයනික ද්‍රව්‍ය මත විශාල වශයෙන් රඳා පවත්නා ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය පිළිබඳව අවධාරණය කරමින් රටේ අපනයන සඳහා වටිනාකමක් ඇති කිරීමට ශක්‍යතාවක් ඇති ඒකීයකරණයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළයුතු බවද ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් අවධාරණය කරන ලදී.

### 3.5. බංග්ලාදේශය සමඟ වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම

2013 අප්‍රේල් 22 වන දින කොළඹදී පවත්වන ලද දෙවන ශ්‍රී ලංකා බංග්ලාදේශ විදේශ කාර්යාල උපදේශන (Sri Lanka Bangladesh Foreign Office Consultations- FOC) අතරතුරදී, වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් (Joint Working Group- JWG) පිහිටුවීම මගින් වෙළඳ සබඳතා ප්‍රවර්ධනය කිරීම උදෙසා  දෙරට විසින් සහයෝගීතාව සඳහා වන නව මංපෙත් සොයාබැලිය යුතු බවට තීරණය කරනු ලැබ ඇත

දෙවන FOC තීරණය අනුව, වෙළඳාම පිළිබඳ බංග්ලාදේශ -  ශ්‍රී ලංකා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු රැස්වීම 2014 පෙබරවාරි 18 සිට 19 දක්වා ඩකා හිදී පවත්වන ලද අතර  එම රැස්වීමේදී, ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර ද්විපාර්ශ්වික වෙළඳාම පුළුල් කිරීම උදෙසා විධික්‍රම හඳුනාගැනීම සඳහා ගිවිසුම් රාමුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට දෙපාර්ශ්වය විසින් එකඟවන ලදී.

ශක්‍යතා අධ්‍යයන වාර්තා කෙටුම්පත් 2014 සැප්තැම්බර් මාසයේදී කොළඹදී පවත්වන ලද වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන රැස්වීම අතරතුරදී හුවමාරු කරගන්නා ලද අතර දෙරටේ පාර්ශ්වකරුවන් සමඟ කෙටුම්පතෙහි කටයුතු අවසන් කිරීමට සහ වලංගු කිරීමට එහිදී එකඟවන ලදී. අදාල පාර්ශ්වකරුවන් සමඟ අධ්‍යයන සහ උපදේශන කටයුතු නිමාවට පත් කිරීමෙන් අනතුරුව, ශක්‍යතාවක් ඇති වරණීය වෙළඳ ගිවිසුමක් (PTA) / නිදහස් වෙළඳ ගිවිසුමක් (FTA) හෝ වෙනත් කවර හෝ ආයතනික යාන්ත්‍රණයක් පිළිබඳව සාකච්ඡා ආරම්භ කළහැකි බවටද දෙපාර්ශ්වය විසින් එකඟතාව පළ කරන ලදී.

### 3.6. ශ්‍රී ලංකාව සහ ජපානය අතර අන්තර් - රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා පණගැන්වීම සඳහා වන අවබෝධතා ගිවිසුම

ජපාන අග්‍රාමාත්‍ය, ගරු ෂින්ෂෝ අබේ (Shinzo Abe) මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අතර තුරදී, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ  ජපාන විදේශ කටයුතු අමාත්‍යාංශයේ අග්නිදිග සහ නිරිතදිග කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සමඟ ජපානයේ ආර්ථික, වෙළඳ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ජාත්‍යන්තර කටයුතු  පිළිබඳ උප-අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා සහ ජපාන රජයන් අතර අන්තර් - රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා ක්‍රියාත්මක කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමක් 2014 සැප්තැම්බර් 07 දින අත්සන් කරන ලදී.

## 4.0 වෙළඳ, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභා

පහත සඳහන් ද්විපාර්ශ්වික ඒකාබද්ධ කොමිෂන් සභා / කමිටු කැඳවීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධානතම ආයතනය වන්නේ වාණිජ දෙපාර්තමේන්තුවයි.

- ශ්‍රී ලංකාව - බංග්ලාදේශය
- ශ්‍රී ලංකාව - ඊජිප්තුව
- ශ්‍රී ලංකාව - ඉරානය
- ශ්‍රී ලංකාව - මාලදිවයින
- ශ්‍රී ලංකාව - ඉරාකය
- ශ්‍රී ලංකාව - කෙන්යාව
- ශ්‍රී ලංකාව - ඇ.එ.ජ.
- ශ්‍රී ලංකාව - ඉන්දියාව
- ශ්‍රී ලංකාව - කුවේටය
- ශ්‍රී ලංකාව - පාකිස්ථානය
- ශ්‍රී ලංකාව - බෙලරුස්
- ශ්‍රී ලංකාව - කටාර්

### 4.1. ඉරානය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ දසවැනි සැසිවාරය

ඉරාන ඉස්ලාමීය ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ දසවැනි සැසිවාරය 2015 ජනවාරි 14 – 15 දිනයන්හිදී ටෙහෙරාන් හිදී පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා විසින් ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙයවූ අතර, ඉරාන ඉස්ලාමීය ජනරජයේ කර්මාන්ත, පතල් සහ වෙළඳ කටයුතු අමාත්‍ය, ගරු මොහමඩ් රේෂා නේමැට් ෂැදේහ් (Mohammad Reza Nemat Zadeh) මැතිතුමා විසින් ඉරානියානු දූත පිරිස මෙහෙයවන ලදී.

ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ මෙම සැසිවාරය අතරතුරදී, ද්විපාර්ශ්වික වශයෙන් වැදගත්වන වෙළඳ, ආර්ථික සහ රේගු, බැංකුකරණය, ප්‍රවාහන, ඉදිකිරීම්, විදුලිබල හා බලශක්ති සහ සංචාරක, අධ්‍යාපනික, සෞඛ්‍ය සහ සංස්කෘතික යන ක්ෂේත්‍රයන් පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී.

### 4.2. ඉරාකය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කමිටුවේ අටවැනි සැසිවාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඉරාක ජනරජය අතර අත්සන් තබන ලද ආර්ථික, විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම අනුව, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා - ඉරාක ඒකාබද්ධ කමිටුවේ අටවැනි සැසිවාරය 2014 පෙබරවාරි 24 සිට 25 වනදා දක්වා ඉරාකයේ බැග්ඩෑඩ් හිදී (Baghdad) පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා විසින් ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙයවූ අතර, ඉරාක ජනරජයේ වෙළඳ අමාත්‍ය අතිගරු ආචාර්ය කයිරුල්ලා හසාන් බාබාකාර් (Kairulla Hasan Babakar) මැතිතුමා විසින් ඉරාක පාර්ශ්වය මෙහෙයවන ලදී.

මෙම සැසිවාරය අතරතුරදී, දෙරටට වැදගත්වන වෙළඳ, මූල්‍ය, බැංකුකරණය, බදුකරණය, ආයෝජන, කෘෂිකර්ම, සංස්කෘතික, ප්‍රවාහන, ශ්‍රම වෙළඳපළ සහ සංචාරක යන ක්ෂේත්‍රයන් පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී.

**4.3. ආර්ථික, වාණිජ සහ තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා - කටාර් ඒකාබද්ධ කොමිසමේ පළමුවැනි සැසිවාරය**

කටාර් රාජ්‍යයේ රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය අතර කටාර් - ශ්‍රී ලංකා ඒකාබද්ධ ආර්ථික කොමිසමේ පළමුවැනි සැසිවාරය 2014 සැප්තැම්බර් 14 සිට 15 වනදා දක්වා දෝහා හිදී පවත්වන ලදී.

ආර්ථික හා වාණිජ කටයුතු අමාත්‍ය, අතිගරු ෂෙයික් අහ්මඩ් බින් ජැසෙම් බින් මොහමඩ් අල් තානි (Sheikh Ahmad Bin Jassem Bin Mohammad Al Thani) මැතිතුමා විසින් කටාර් රාජ්‍යයේ දූත පිරිස මෙහෙයවූ අතර, ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා විසින් ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙයවන ලදී.

වෙළඳාම, ආයෝජනය, කෘෂිකර්මාන්තය හා ආහාර කර්මාන්තය, සංස්කෘතිය හා කලාව සහ අධ්‍යාපනය යනාදී අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙනදෙන මාතෘකාවන් පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල නගර සංවර්ධන වැඩසටහන (University township program) සඳහා මූල්‍යාධාර ලබාගැනීම සඳහා පවත්නා ශක්‍යතාව සොයාබැලීමට කටාර් පාර්ශ්වය එකඟ වන ලදී. කටාර් රාජ්‍යයේ රාජ්‍ය වැඩ අධිකාරිය (Pubic Work Authority) විසින් කටාර් රාජ්‍යයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලාංකික ඉදිකිරීම් සමාගම් සාදරයෙන් පිළිගනු ලැබේ.

**4.4. ශ්‍රී ලංකා - බෙලරූස් පළමු ඒකාබද්ධ ආර්ථික සහයෝගීතාව**

දෙරට අතර පවත්නා ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව, 2013 අගෝස්තු මාසයේ ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ බෙලරූස් රාජ්‍ය සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකාව සහ බෙලරූස් අතර වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ ගිවිසුමක් අත්සන් කරන ලදී. එහි ඊළඟ පියවර වශයෙන්, ශ්‍රී ලංකා - බෙලරූස් ඒකාබද්ධ ආර්ථික සහයෝගීතාව පිළිබඳ පළමුවැනි හමුව 2014 ජූලි 9 සිට 10 දක්වා කොළඹදී පවත්වන ලදී.

මෙම ද්විපාර්ශ්වික සාකච්ඡා අතරතුරදී, දෙපාර්ශ්වය විසින් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබාගැනීමට වෙළඳ සහ වාණිජ සබඳතා වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා නව මංපෙත් සොයාබැලීමට එකඟවන ලදී. තවද, බෙලරූස් පාර්ශ්වය විසින් ශ්‍රී ලංකාව තුළ ට්‍රැක්ටර් එකලස් කිරීමේ යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවී සිටියි.

පළමුවැනි ද්විපාර්ශ්වික සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන්, බෙලරූස් රජය විසින් 2014 නොවැම්බර් 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාව අක් වෙරළ රටවල් ලැයිස්තුවෙන් ඉවත්කරන ලදී. මෙම ඉවත්කිරීමේ ඍජු ප්‍රතිලාභය වන්නේ, ශ්‍රී ලාංකික අපනයනකරුවන් ඔවුන්ගේ අපනයන ඉපැයුම් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කිරීම මත 15%ක බද්දක් ගෙවීමට තවදුරටත් යටත් නොවීමයි.

**4.5. ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර වෙළඳාම පිළිබඳ අනු කමිටුවේ නියමයන් පිළිබඳ හමුව**

දෙරට අතර වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ අනු කමිටුවක් පිහිටුවීම සම්බන්ධයෙන් වන නියමයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය, ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා විසින් නිල දූත පිරිසක් කැටුව 2014 අගෝස්තු 21 සහ 22 දිනයන්හිදී වියට්නාමයේ සංචාරයක නිරත විය.

මෙම සංචාරය අතරතුරදී, දෙරට විසින් වෙළඳ සහ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා නව මංපෙත් සොයාබැලීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර වෙළඳාම පිළිබඳ අනු-කමිටුවක් පිහිටුවීම සඳහා එකඟවන ලදී. වෙළඳාම පිළිබඳ අනු-කමිටුවේ පළමුවැනි සැසිවාරය නොබෝ දිනකින් පැවැත්වීමටද තවදුරටත් එකඟවන ලදී.

**4.6. එක්සත් ජනපද - ශ්‍රී ලංකා වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ ගිවිසුම් රාමුව (TIFA) යටතේ ඒකාබද්ධ කවුන්සිලයේ 11 වැනි සැසිවාරය**

වෙළඳ සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ප්‍රගතිය ඇගයීම සඳහා එක්සත් ජනපද - ශ්‍රී ලංකා වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ ගිවිසුම් රාමුව (TIFA) යටතේ ඒකාබද්ධ කවුන්සිලයේ 11වැනි සැසිවාරය 2014 ඔක්තෝබර් 15 දින පවත්වන ලදී. මෙහිදී, වෙළඳපළ ප්‍රවේශය, එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය (US GSP), කම්කරු, වෙළඳ ප්‍රවර්ධන ප්‍රයත්නයන් , බුද්ධිමය දේපළ හිමිකම්, කෘෂිකර්මාන්තය, සහ ක්ෂේත්‍ර - විශේෂී ආයෝජන අභියෝග ඇතුළත් වෙළඳ සහ ආයෝජන ගැටළු ඇතුළු පුළුල් පරාසයක් පිළිබඳව දෙපාර්ශ්වය විසින් සාකච්ඡා කරන ලදී. මෙම සියලුම වෙළඳ සහ ආයෝජන ගැටළු පිළිබඳ සාකච්ඡාවල ප්‍රගතිය මගින් සියලු දෑ ඇතුළත් ආර්ථික සංවර්ධනය සඳහා ශක්තිමත් අඩිතාලමක් ලබාදෙමින් ආර්ථික වර්ධනය දිරිමත් කරනු ලැබේ.

වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ ගිවිසුම් රාමුවේ නිල රැස්වීම් පැවැත්වෙන අතරතුරදී, වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ ගිවිසුම් රාමු ක්‍රියාවලිය මගින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සාකච්ඡා දිරිමත් කෙරෙන අතර පෞද්ගලික - රාජ්‍ය හවුල් සම්මේලන, ව්‍යාපාරික අවස්ථා සහ ආයෝජන සංසද සඳහා පහසුකම් සලසා දෙන ලදී. මෙම සම්ප්‍රදාය අනුගමනය කරමින්, එක්සත් ජනපද - ශ්‍රී ලංකා ව්‍යාපාරික සංසදය 2014 ඔක්තෝබර් 16 දින ලංකා වාණිජ මණ්ඩලයේදී පවත්වන ලද අතර, එක්සත් ජනපද ආහාර සහ ඖෂධ පරිපාලනය, වොෂින්ටනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, වාණිජ දෙපාර්තමේන්තුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය යන ආයතනවල සහයෝගය ඇතිව ආහාර සහ ඖෂධ පරිපාලනය පිළිබඳ වීඩියෝ සම්මන්ත්‍රණය 2014 දෙසැම්බර් 10 දින පවත්වන ලදී.

**4.7. කෙන්යාව සහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ වෙළඳ කමිටුවේ පළමුවැනි සැසිවාරය**

දෙරට අතර වෙළඳාම පුළුල් කිරීමේ අරමුණින් යුතුව, අතිගරු ජනාධිපතිතුමාගේ කෙන්යා සංචාරය අතරතුරදී, ශ්‍රී ලංකාව සහ කෙන්යාව අතර ද්විපාර්ශ්වික වෙළඳාම පිළිබඳ අවබෝධතා ගිවිසුමක් මගින් ශ්‍රී ලංකාව සහ කෙන්යාව අතර ඒකාබද්ධ වෙළඳ කමිටුව (JTC) ස්ථාපනය කරන ලදී. මේ යටතේ, ශ්‍රී ලංකාව සහ කෙන්යාව අතර ඒකාබද්ධ වෙළඳ කමිටුවේ පළමු රැස්වීම 2014 නොවැම්බර් 11 දින කොළඹදී පවත්වන ලදී. මෙම රැස්වීම අතරතුරදී, දෙපාර්ශ්වය විසින් සහයෝගීතා ක්ෂේත්‍ර පුළුල් පරාසයක් පිළිබඳව සාකච්ඡා කරන ලදී.

දෙරට රේගු අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මගින් රේගු සහයෝගීතාව ශක්තිමත් කිරීම, අපනයන ප්‍රවර්ධන ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම, දෙරට වෙළඳ මණ්ඩල අතර විශේෂයෙන්, යොවුන් ව්‍යවසායක සංගම් අතර සහයෝගීතාව ශක්තිමත් කිරීම, දෙරට පවත්වනු ලබන වෙළඳ සල්පිල් සඳහා අන්‍යෝන්‍ය වශයෙන් සහභාගිවීම, ජාතික ආනයන සහ අපනයන වෙළඳ සංඛ්‍යාලේඛන සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග හුවමාරු කරගැනීම, වෙළඳාම සහ කර්මාන්ත ආශ්‍රිත ගැටළු පිළිබඳව තොරතුරු හෝ පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා මූලස්ථාන හඳුනාගැනීම සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සහයෝගීතාව ඇතිකර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් මෙම රැස්වීම අතරතුරදී යෝජනා කරන ලදී.

තේ කර්මාන්තය තුළ තාක්ෂණය හුවමාරු කරගැනීම සම්බන්ධයෙන් සහයෝගීතාව, පොල් කර්මාන්තය තුළ ආයෝජන අවස්ථා සහ තාක්ෂණය හුවමාරු කරගැනීම සම්බන්ධයෙන් සහයෝගීතාව, ශ්‍රී ලංකාවට කිරි නිෂ්පාදන වෙළඳාම ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සහ කුකුළු පැටවුන් ඇතිකිරීම පිළිබඳ දැනුම බෙදාගැනීම සම්බන්ධයෙන් පශු සම්පත් ක්ෂේත්‍රය තුළ සහයෝගීතාව, සංචාරක කර්මාන්තය තුළ සහයෝගීතාව සහ ආයෝජන අවස්ථා, සම් භාණ්ඩ ක්ෂේත්‍රය තුළ සහයෝගීතාව යනාදිය සම්බන්ධයෙන් කෙන්යා පාර්ශ්වය විසින් යෝජනා කරන ලදී.

## 5.0 බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සහසම්බන්ධතාවක් ද පවත්වාගෙන යනු ලැබේ.

### 5.1 ලෝක වෙළඳ සංවිධානය (WTO)

2014 වර්ෂයේදී, ලෝක වෙළඳ සංවිධානයේ සාමාජික රාජ්‍යයන් විසින්, 2013 වර්ෂය අවසානයේදී පවත්වන ලද 10වැනි අමාත්‍ය සමුළුවේදී ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. සාමාජික රාජ්‍යයන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු කරන ලද්දේ, නෛතික ලියවිලි මනා ලෙස සංස්කරණය කිරීම සහ ගිවිසුම බලාත්මක කිරීම ක්‍රියාත්මක කිරීමට හැකි වන එකී විධි විධාන පිළිබඳව සාමාජික රාජ්‍යයන් වෙත නිවේදනය කිරීම ඇතුළුව වෙළඳාම් පහසුකරණය පිළිබඳ ගිවිසුම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීම කෙරෙහිය. ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් වලට වෙළඳාම් පහසුකරණය පිළිබඳ ගිවිසුම අන්තර්ගත කිරීම සඳහා වන සන්ධාන ගිවිසුම අපරානුමැතිය සඳහා 2014 වර්ෂය අවසානයේ සිට 2015 ජූලි 31 වන තුරු විවෘතව පැවතුණි.

වෙළඳාම් පහසුකරණය පිළිබඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ ආරම්භක නිවේදනය සකස් කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව විසින් මුදල් අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව යනාදී අදාළ ආශ්‍රිත ආයතන සහ රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරන ලදී. මීට අමතරව, ගිවිසුමේ අනෙකුත් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවන් පවත්නේ කොහේද යන්න නිශ්චය කරගැනීම සහ තාක්ෂණික සහ/ හෝ මූල්‍ය ආධාර අවශ්‍ය විය හැකි එකී ප්‍රදේශ හඳුනාගැනීම පිණිස

අදාළ බලධාරීන් හමුවීම සඳහා 2015 වර්ෂය සඳහා ලෝක බැංකුවෙන් දූත පිරිසක් සංවිධානය කිරීමට වාණිජ දෙපාර්තමේන්තුව විසින් ජිනීවාහි සිටින නිත්‍ය දූත මණ්ඩලය සමඟ එක්ව ප්‍රාරම්භක කටයුතු සිදුකරන ලදී.

තවද, සාමාජිකයන් විසින්, 2009 වර්ෂයේදී සාකච්ඡා නතරවී තිබූ දෝහා සංවර්ධන වටය පිළිබඳ පශ්චාත්-බාලි ක්‍රියාකාරී වැඩසටහනක් (post-Bali Work Programme) සකස් කිරීමෙහිලා අඛණ්ඩව කටයුතු කරන ලදී. තීරණාත්මක ප්‍රදේශ, විශේෂයෙන්, කෘෂිකර්මාන්තය, කෘෂිකාර්මික නොවන වෙළඳපළ ප්‍රවේශය (NAMA) සහ සේවා පිළිබඳ සාකච්ඡා සම්මුති ඉදිරියට පවත්වාගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳව සාකච්ඡා සම්මුති කමිටු සභාපතිවරුන්ගේ නිරන්තර සාකච්ඡා සහ උපදේශනයන් මෙයට ඇතුළත් වේ. කෙසේවෙතත්, අවසානයේදී තහවුරුවූ එකඟවූ තත්වයන්ගෙන් සාකච්ඡා සම්මුති ඉදිරියට පවත්වාගෙන යායුතු බවට සාමාජික රාජ්‍යයන් කිහිපයක් යෝජනා කරන අතරතුර 2009 වර්ෂයේදි දක්නට තිබූ සම්පූර්ණ අවහිරය මඟහරවා ගැනීම සඳහා "නව ප්‍රවේශයන්" සළකා බැලීමට අනෙකුත් සාමාජික රාජ්‍යයන් විසින් යෝජනා කිරීමත් සමඟ මෙම තත්වයන් සම්පූර්ණයෙන්ම වෙනස් විය. ශ්‍රී ලංකාව විසින් විශේෂයෙන්, ශ්‍රී ලංකාව ඉතා රුචිකත්වයක් දක්වන කෘෂිකර්මාන්තය සහ කෘෂිකාර්මික නොවන වෙළඳපළ ප්‍රවේශය පිළිබඳ සාකච්ඡා සම්මුති බොහොමයක් සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වන ලදී.

2014 වර්ෂයේදී, වාණිජ දෙපාර්තමේන්තුවේ බහු පාර්ශ්වික අංශය විසින්ද ලෝක වෙළඳ සංවිධානය සමඟ තාක්ෂණික සහාය ක්‍රියාකාරකම් ද්විත්වයක් සම්බන්ධීකරණය කරන ලදී. ඉන් එකක් සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක නියමයන් පිළිබඳ ගිවිසුම සම්බන්ධයෙන් වන අතර, අනෙක බුද්ධිමය දේපළ සඳහා අදාල වේ. සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) සම්මන්ත්‍රණය මගින් රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම සහභාගිවන්නන් සඳහා සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක පිළිබඳ ගිවිසුම, එය ක්‍රියාත්මක කිරීම, ගිවිසුම යටතේ අයිතිවාසිකම් සහ බැඳීම් සහ සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක නියමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අදාල ගැටළු පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදෙන ලදී. මීට අමතරව, භූගෝලීය දර්ශකයක් ලෙස ශ්‍රී ලංකා කුරුඳු පිළිබඳ තොරතුරු ලේඛණයක් සකස්කිරීමෙහිලා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත සහාය දැක්වීම සඳහා ලෝක වෙළඳ සංවිධානයෙන් තාක්ෂණික දූත පිරිසක්ද සම්බන්ධීකරණය කරන ලදී.

## 5.2 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි. මෙම යෝජනා ක්‍රමය යටතේ, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී මෙක්සිකෝව හා පේරු යන රාජ්‍යයන් වෙත ශ්‍රී ලංකාව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 19.17ක් වටිනා භාණ්ඩ තොගයක් අපනයනය කරනු ලැබ ඇත.

## 5.3. වරණීය පොදු ක්‍රමය (GSP)

### (අ) යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (EU GSP ) යෝජනා ක්‍රමය

යුරෝපා කොමිසම සහ යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව විසින්, 2014.01.01 දින සිට ක්‍රියාත්මක වූ නව GSP යෝජනා ක්‍රමය අනුමත කරනු ලැබ ඇත. නව යෝජනා ක්‍රමයේ අරමුණු වන්නේ:

- අවශ්‍යතාවයෙන් පෙළෙන රටවල් සඳහා වඩා හොඳ අවධානයක් යොමුකිරීම;
- තිරසාර සංවර්ධනය සහ යහ පාලනය පිළිබඳ මූලික ප්‍රතිපත්ති තවදුරටත් ප්‍රවර්ධනය කිරීම;
- නෛතික නියතභාවය සහ ස්ථාවරත්වය වර්ධනය කිරීම.

ශ්‍රී ලංකාව, මෙම නව යෝජනා ක්‍රමය යටතේ ඇති සාමාන්‍ය GSP වරණය ක්‍රමය සඳහා අර්ථලාභියෙකු වේ.

යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමයේ **කලාපයන් අතර සමුච්චිත (Cross Regional Cumulation)** විධිවිධාන යටතේ, ඉන්දුනීසියානු සම්භවීය HS ශීර්ෂ 2401 හි නොනිමි දුම්කොළ සහ ප්‍රතික්ෂේපිත දුම්කොළ රැස් කිරීමට ශ්‍රී ලංකාවද හිමිකම් ලබා ඇත.

**(ආ) නෝර්වේ GSP + යෝජනා ක්‍රමය**

නෝර්වේ රජය විසින් 2013 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පහළ මධ්‍යම ආදායම් ලාභී රටවල් සඳහා නව GSP+ ප්‍රවර්ගයක් හඳුන්වා දෙනු ලැබ ඇත. ශ්‍රී ලංකාව, මෙම පහසුකම යටතේ ප්‍රතිලාභ ලැබීම සඳහා හිමිකම් ලබන රටවල් 17 අතර සිටියි. ශ්‍රී ලංකාව, 1972 සිට නෝර්වේයානු GSP පහසුකම යටතේ ප්‍රතිලාභ ලබමින් සිටින අතර, 2013 වර්ෂයේ සිට නව GSP+ තත්වය භුක්තිවිඳීම සඳහා වන නිර්ණායක සපුරා ඇත.

නෝර්වේ රාජ්‍යය වෙත නව තීරුබදු රහිත වෙළඳපළ ප්‍රවේශයක් නිර්මාණය කරමින්, නෝර්වේ රාජ්‍යය වෙත ශුන්‍ය තීරුබදු මත භාණ්ඩ අපනයනය කිරීම සඳහා නව GSP+ පහසුකම මගින් ශ්‍රී ලංකාව වෙත හැකියාව ලබා දේ. මෙම නව GSP+ තත්වය මගින් HS 61, 62 සහ 63 යන පරිච්ඡේද යටතේ සියලුම රෙදිපිළි අයිතමයන් සඳහා 100%ක තීරුබදු රහිත ප්‍රවේශයක් විවෘත කරනු ලැබ ඇත.

## 6.0 කලාපීය ආර්ථික සහයෝගීතාව

ශ්‍රී ලංකාව, ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) වැනි එහි කලාපීය වෙළෙඳ හා ආර්ථික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් රඟදක්වන්නෙකු ලෙස තවදුරටත් කටයුතු කරන ලදී.

### 6.1 ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

"බැංකොක් ගිවිසුම" ලෙස මීට පෙර හඳුන්වනු ලැබූ ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම 2005 නොවැම්බර් 02 දින අත්සන් කරන ලද අතර, 2006 සැප්තැම්බර් 01 දින සිට බලාත්මකව ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකාව විසින්, පිළිවෙලින් 2014 මැයි, ජූලි සහ නොවැම්බර් යන මාසවලදී ආසියා -පැසිෆික් වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුවේ 43වැනි, 44 වැනි සහ 45වැනි සැසිවාරයන් සඳහා සාර්ථක ලෙස සහභාගි වන ලදී. තායිලන්තයේ බැංකොක් හිදී 2015 පළමු භාගය තුළදී පැවැත්වීමට නියමිත ආසියා -පැසිෆික් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය සභාවේ 4වැනි සැසිවාරය අතරතුරදී 4වැනි වටයේ සාකච්ඡා අවසන් කිරීමට සාමාජික රාජ්‍යයන් විසින් තීරණය කරනු ලැබ ඇත.

තීරුබදු සහන පුළුල් කිරීම, ප්‍රභවස්ථාන රීති (Rules of Origin) ලිහිල් කිරීම සහ වෙළඳාම් පහසුකරණය, ආයෝජනය සහ සේවා පිළිබඳ ගිවිසුම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වන සැලැස්ම යනාදිය පිළිබඳ සාකච්ඡා, ස්ථාවර කමිටු රැස්වීම්වලදී අවධානය යොමුවූ ප්‍රධාන ක්ෂේත්‍රයන්ට ඇතුළත් විය.

ආසියා -පැසිෆික් වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුවේ 45වැනි සැසිවාරයට සමගාමීව ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුමේ ව්‍යාපාරික සංසදය පවත්වන ලදී. මෙම සංසදයේ ප්‍රධාන අරමුණ වූයේ, ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුමේ ඉදිරි සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වන අවශ්‍යතාව පිළිබඳව ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුමේ පෞද්ගලික අංශය අතර පොදු එකඟතාවක් ගොඩනැගීමයි.

2014 වර්ෂයේ පළමු භාගය තුළදී, ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුමේ සාමාජික රාජ්‍යයන් වෙත මුළු අපනයන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 44.3ක අගයක් වූ අතර ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 33ක් වටිනා භාණ්ඩ චීනය වෙත අපනයනය කරන ලදී.

## 6.2 දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)

1985දී ස්ථාපිත කරන ලද දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය, (SAARC) ආරම්භක අදියරේදී සෞඛ්‍ය, ජනගහනය, කාලගුණ විද්‍යාව, විදුලි සංදේශ, ක්‍රීඩා, සංස්කෘතිය වැනි සංවේදී ක්ෂේත්‍රයන්ට පමණක් සීමාවන ලදී. සාර්ක් රාමුව තුළ නිශ්චිත සහ ප්‍රතිඵල පාදක ක්‍රියාකාරකම්වල අවශ්‍යතාව පිළිබඳව 1988 දෙසැම්බර් මාසයේදී ඉස්ලාමාබාද්හිදී පැවති 4වැනි සාර්ක් සමුළුවේදී අවධාරණය කරන ලදී.  ඒ අනුව, සාර්ක් රටවල් අතර වෙළඳාම ලිහිල්කිරීමේ අදහස ශ්‍රී ලංකාව විසින් පළමුවෙන්ම 1991 දෙසැම්බර් මාසයේදී කොළඹදී පැවති 6වැනි සාර්ක් සමුළුවේදී සාකච්ඡාවට ඉදිරිපත් කරන ලදී.  දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)  1993 අප්‍රේල් මස 11 දින අත්සන් කරන ලදුව 1995 දෙසැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම ගිවිසුම මගින් පිළිබිඹු වන ලද්දේ, සහන හුවමාරු කර ගැනීම තුළින් සාර්ක් කලාපය තුළ අන්‍යෝන්‍ය වෙළඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙනයාම සඳහා සාමාජික රාජ්‍යයන්ගේ කැමැත්තයි.

මූලික වශයෙන් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) හා ඉන් අනතුරුව රේගු සංගමය දෙසට යොමු වීමේ ප්‍රථම පියවර ලෙස දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුම (SAPTA) ආරම්භ කරන ලදී. එබැවින්, අනාගතයේදී දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුම වෙනුවට  ක්‍රමිකව දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම ආදේශ කෙරේ. ඒ අනුව, දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුම යටතේ තීරුබදු වරණය භාවිතය වර්ෂයෙන් වර්ෂය අඩුවෙමින් පවතී. 2014 වර්ෂය තුළදී, ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුම යටතේ ඉන්දියාව සහ පාකිස්ථානය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 3.34ක පමණ වටිනාකමින් යුතු භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත.

කලාපයේ ඌන සංවර්ධිත රාජ්‍යයන් (LDCs) සඳහා දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුමේ (SAPTA) සහන පවත්වාගෙන යාම පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන්, ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන්ගේ (Non-LDCs) සාමාජික රටවල් විසින් ඌන සංවර්ධිත රාජ්‍යයන්ගේ  සාමාජික රටවල් සඳහා වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන (TLP) නිමාවට පත්කළ වහාම, ඌන සංවර්ධිත රාජ්‍යයන්ගේ  සාමාජික රටවල් සඳහා  දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුමේ සහන නවතාලිය හැකි බවට කමිටුව විසින් එකඟතාව පළ කරන ලදී. එහෙත්, ඌන සංවර්ධිත රාජ්‍යයන් සඳහා දකුණු ආසියානු වරණීය වෙළඳ  ගිවිසුමේ සහන පවත්නා කවර හෝ අයිතමයක් ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන්ගේ  සංවේදී අයිතම ලැයිස්තුවල දක්නට ලැබෙන්නේ නම්, පවත්නා රීති ලිහිල් කිරීම තුළින් ඒවා එක හා සමාන සහන මට්ටමින් පවත්වාගෙන යායුතුය. වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන

යටතේ පවත්නා අයිතමයන් දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු වරණ භුක්තිවිඳින්නේ නම්, ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන් විසින්, වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන සඳහා පාදක අනුපාතිකය සඳහා එකඟවී ඇති දිනයේදී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම යටතේ, ඌන සංවර්ධිත රාජ්‍යයන් සඳහා අදාළ අනුපාතිකයට වඩා නොවැඩි අනුපාතිකයකට එම අයිතමයන් මත තීරුබදු අඩුකළ යුතු බවට කමිටුව විසින් තවදුරටත් එකඟවී ඇත. නිෂ්පාදනයන්, සංවේදී අයිතම ලැයිස්තුවල පවතින්නේද නැද්ද යන්න නොතකමින්, ඌන සංවර්ධිත ගිවිසුම්කාර රාජ්‍යයන් විසින් වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන නිමාවට පත්වන තුරු ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන් සඳහා සහන පවත්වාගෙන යාම සිදුකළ යුතු බවටද දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ (SAFTA) පළමු වැනි අමාත්‍ය සභා හමුවේදී එකඟවන ලදී.

### 6.3. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 2004 ජනවාරි මාසයේදී පාකිස්ථානයේ ඉස්ලාමාබාද්හිදී පැවැත්වූ 12 වන සාර්ක් සමුළුව අතර තුරදී අත්සන් කරන ලද අතර, 2006 ජනවාරි 01 දින සිට බලාත්මකව ක්‍රියාත්මක කරන ලදී. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අරමුණ වන්නේ, 1995 වර්ෂයේ දී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ස්ථාපිත කිරීමත් සමඟ ඇරඹි වරණීය වෙළඳ ප්‍රවර්ධනය තුළින් කලාපීය ආර්ථික ඒකීයකරණ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීමයි.

2016 වන විට වසර දහයක් තුළ නිමකිරීමට සැලසුම් කරන ලද දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන (TLP) යටතේ, කලාපීය රටවල නිෂ්පාදන මත අය කරනු ලබන තීරුබදු ප්‍රගතිශීලී ලෙස අඩු කරනු ලබනු ඇත. ශ්‍රී ලංකාව විසින්, 2008.12.31 වන විට ඌන සංවර්ධිත රාජ්‍යයන්ගේ (LDCs) සාමාජික රටවල් සඳහාත්, 2014.12.31 වන විට ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන්ගේ (Non-LDCs) සාමාජික රටවල් සඳහාත් 0 - 5% දක්වා එහි තීරුබදු පහත හෙළිය යුතුය. ඌන සංවර්ධිත රාජ්‍යයන් (LDCs) විසින් (LDCs: ඇෆ්ඝනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, මාලදිවයින සහ නේපාලය) වසර 2016 වන විට සමාන වාරික අටකින් 0- 5% දක්වා එහි තීරුබදු පහත හෙළිය යුතුය. ඉන්දියාව සහ පාකිස්ථානය විසින්, 2008.12.31 වන විට ඌන සංවර්ධිත රාජ්‍යයන්ගේ (LDCs) සාමාජික රටවල් සඳහාත්, 2013.12.31 වන විට ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන්ගේ (Non-LDCs) සාමාජික රටවල් සඳහාත් වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන (TLP) නිමාවට පත්කළ යුතුය. ශ්‍රී ලංකාව, එහි ආර්ථිකයේ ප්‍රමාණයෙන් සහ අවදානම් සහගත බවින් යුක්ත වූ නිසාවෙන් පෙර කී ලෙස ඌන සංවර්ධිත නොවන රාජ්‍යයක් වුවද, 2014 වන විට ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන් සඳහා තම වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන නිමාවට පත්කිරීම සඳහා අනෙකුත් සාමාජික රාජ්‍යයන්ගේ එකඟතාව ලබා ගැනීමට හැකිවන ලදී.

2014 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ බංග්ලාදේශය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පාකිස්ථානය වෙත වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 12.59 ක් වටිනා භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත. එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී 6 ගුණයක පමණ වර්ධනයකි.

එක් එක් සාමාජික රාජ්‍යය විසින් දෙවැනි අදියර යටතේ 20% කින් නිශේධනාත්මක අයිතම ලැයිස්තු අඩුකිරීම සෑම සාමාජික රාජ්‍යයක් විසින්ම ක්‍රියාත්මක කරනු ලැබ ඇත. 20% අඩුකිරීමට පෙරාතුව සහ අනතුරුව සාමාජික රාජ්‍යයන්ගේ නිශේධනාත්මක අයිතම ලැයිස්තු පහත සඳහන් පරිදි වේ;

(වගු අංක 02)

| සාමාජික රාජ්‍යය | 20% අඩුකිරීමට පෙරාතුව නිශේධනාත්මක අයිතම ලැයිස්තු | | 20% අඩුකිරීමෙන් අනතුරුව නිශේධනාත්මක අයිතම ලැයිස්තු | |
|---|---|---|---|---|
| | ඌන සංවර්ධිත රටවල් | ඌන සංවර්ධිත නොවන රටවල් | ඌන සංවර්ධිත රටවල් | ඌන සංවර්ධිත නොවන රටවල් |
| ඇෆ්ඝනිස්ථානය | 1,072 | | 850 | |
| බංග්ලාදේශය | 1,233 | 1,241 | 987 | 993 |
| භූතානය | 150 | | 150 | |
| ඉන්දියාව | 480 | 868 | 25 | 614 |
| මාලදිවයින | 681 | | 152 | |
| නේපාලය | 1,257 | 1,295 | 998 | 1,036 |
| පාකිස්ථානය | 1,169 | | 936 | |
| ශ්‍රී ලංකාව | 1,042 | | 837 | 963 |

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පහත සඳහන් රැස්වීම් පවත්වන ලදී.

1. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ නවවැනි සභාවාරය, තිම්පු, 2014 ජූලි 22 සිට 23 දක්වා.
2. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය සභාවේ අටවැනි සභාවාරය, තිම්පු, 2014 ජූලි 24.

ඉහත සඳහන් සභාවාරයන්හිදී පහත සඳහන් ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමේ (SAPTA) සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ (SAFTA) ප්‍රභවස්ථාන රීතීන්ට අදාළ සත්‍යාපන යාන්ත්‍රණයක් (Verification Mechanism) ක්‍රියාත්මක කිරීම.
- සාර්ක් - ආසියානු සංවර්ධන බැංකු කලාපීය ආර්ථික ඒකීයකරණ අධ්‍යයනයට (II වන අදියර) අදාළ ගැටළු පිළිබඳව සළකාබැලීම.
- වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (III වන අදියර) යටතේ සහ සංවේදී අයිතම ලැයිස්තුවේ පවත්නා තීරුබදු සුළු සංඛ්‍යාවක් හැර, සියලු නිෂ්පාදන මත පවත්නා ඉහළ තීරුබදු වසර 2020 වන විට 0 - 5% දක්වා අඩුකළ හැකි බවට භූතානය, ඉන්දියාව, මාලදිවයින සහ පාකිස්ථානය යන රටවල් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අනුව සංවේදී අයිතම ලැයිස්තු අඩුකිරීම.
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සේවා වෙළඳාමට අදාළ ගැටළු.
- තීරුබදු නොවන ක්‍රියාමාර්ග / පැරා - තීරුබදු ක්‍රියාමාර්ගයන්ට අදාළ ගැටළු.
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙන් පරිබාහිරව සාර්ක් කලාපය තුළ වෙළඳ ප්‍රවාහයන්ට අදාළ ගැටළු.
- ඌන සංවර්ධිත රටවලට (LDCs) අදාළ ගැටළු.
- යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය යටතේ අධි කලාපීය සමුච්චිතය (Super Regional Cumulation) ආශ්‍රිත ගැටළු.

## 6.4. සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)

2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද පසුගිය 16 වැනි සාර්ක් සමුළුව අතර තුරදී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත අත්සන් කරන ලදී. සියලුම රටවල් මෙම ගිවිසුම සඳහා එකඟතාව පළ කරන ලද අතර සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතවන ලදී.

සාමාජික රටවල් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටිනු ලැබේ. බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව සහ නේපාලය විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ අනුමත අවසාන අර්පණ ලැයිස්තු දැනටමත් ඉදිරිපත් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ බැඳීම් උපලේඛනය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් එය නිරීක්ෂණ සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමුකරනු ලැබ ඇත.

## 6.5. ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (Indian Ocean Rim Association)

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) යනු, ඉන්දියානු සාගර වටද්දර රටවල් අතර සහයෝගීතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ විද්වත් ප්‍රජාව යන ත්‍රෛ පාර්ශ්වයයන් එකට කැටුව එන, එම රටවල් අතර පිහිටුවා ගන්නා ලද කලාපීය සංසදයකි.

වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI), ඉන්දියානු සාගර වටද්දර රටවල ව්‍යාපාරික සංසදය (IORBF) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායම (IORAG) යනාදී වශයෙන්, පාර්ශ්ව කණ්ඩායම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් මේ යටතේ පිහිටුවා ඇත. කලාපයේ සහ සාමාජික රාජ්‍යයන්ගේ තිරසාර වර්ධනය සහ තුලිත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කලාපීය ආර්ථික සහයෝගීතාව උදෙසා පොදු පදනමක් ඇතිකිරීම සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) විසින්, (i) සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතතාව, (ii) වෙළඳාම් සහ ආයෝජන පහසුකරණය, (iii) ධීවර කළමනාකරණය, (iv) ආපදා අවදානම් කළමනාකරණය, (v) අධ්‍යයන, විද්‍යා හා තාක්ෂණ, (vi) සංචාරක හා සංස්කෘතික හුවමාරු යනාදී ප්‍රමුඛ ක්ෂේත්‍ර හයක් හඳුනාගෙන ඇත.

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ අමාත්‍ය සභාවේ 14 වැනි සභාවාරය සහ ආශ්‍රිත හමු 2014 ඔක්තෝබර් 06 සිට 09 දක්වා ඕස්ට්‍රේලියාවේ පර්ත් හිදී පවත්වන ලදී. වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ (WGTI) රැස්වීම අතරතුරදී, රටවල් බොහොමයක් විසින් ඔවුන්ගේ නව ව්‍යාපෘති යෝජනා සහ දැනටමත් ක්‍රියාත්මක කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්හි යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාව විසින්, කලාපය තුළ ආයෝජනය සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ සාමාජික රාජ්‍යයන් තුළ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා වන සංස්ථායික යාන්ත්‍රණ පිළිබඳව අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම වෙත සැකෙවින් දක්වන ලද අතර, සාමාජික රාජ්‍යයන්ගෙන් තවදුරටත් අදහස් කැඳවන ලද අධ්‍යයනය ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායම විසින් අනුමත කරනු ලැබ ඇති බව වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් සඳහන් කරන ලදී. ඉන්දියානු සාගර නිරීක්ෂණය සහ පුරෝකථන පද්ධතිය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීමේ යෝජිත ව්‍යාපෘතිය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරි කමිටුවේ අනුමැතියට යටත්ව ඇමෙරිකානු ඩොලර් 30,000ක ප්‍රමාණයක් ලබාදෙන බව වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම විසින් නිර්දේශ කරන ලදී. මෙම හමු

අතරතුරදී, ශ්‍රී ලංකාව විසින් සාමාජික රටවල බොහෝ ව්‍යාපෘති සඳහා සිය කැමැත්ත සහ සහාය පළ කරන ලදී.

### 6.6 බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC)

බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල් හතකින් සමන්විත බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) අරමුණ වන්නේ, සාමාජික රටවල් අතර වෙළඳ ප්‍රවාහයන් වැඩිදියුණු කිරිම සහ කලාපය තුළ වඩා හොඳ ආර්ථික සබඳතා ගොඩනැගීමයි.

තෙවැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සමුළුව, 14වැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ අමාත්‍ය හමුව සහ 16 වැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරි හමුව මාර්තු 1-4 දක්වා මියන්මාරයේ Nay Pyi Taw හිදී පවත්වන ලදී.

අමාත්‍ය හමුව අතරතුරදී, සාමාජික රටවල විදේශ අමාත්‍යවරුන් විසින් බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය සමාලෝචනය කරන ලද අතර පහත සඳහන් සාධන පත්‍ර අත්සන් කිරීම සඳහා සිය කැමැත්ත පළ කරන ලදී ;

- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) ස්ථිර ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරිම පිළිබඳ සාංගමික සංස්ථා පත්‍රය
- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC සංස්කෘතික කර්මාන්ත කොමිසමක් සහ බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) සංස්කෘතික කර්මාන්ත නිරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරිම පිළිබඳ අවබෝධතා ගිවිසුම
- කාලගුණය සහ දේශගුණය සඳහා බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළව බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සාමාජික රටවල් අතර සාංගමික සංස්ථා පත්‍රය

ඊළඟ වෙළඳ හා ආර්ථික අමාත්‍ය හමුව අතරතුරදී පහත සඳහන් ගිවිසුම් අත්සන් කරනු ලැබීමට ජ්‍යෙෂ්ඨ නිලධාරි හමුවේදී එකඟවන ලදී;

- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC FTA) සම්බන්ධයෙන් වන ගිවිසුම් රාමුවේ භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම
- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC FTA) සම්බන්ධයෙන් වන ගිවිසුම් රාමුව සංශෝධනය සඳහා වන සන්ධාන ගිවිසුම
- ආරවුල් බේරුම්කිරීමේ ක්‍රියාපටිපාටි සහ ගිවිසුම් රාමුවේ යාන්ත්‍රණය පිළිබඳ ගිවිසුම
- රේගු කටයුතු සම්බන්ධයෙන් සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ආධාර පිළිබඳ ගිවිසුම

ඉලක්කම් 6ක මට්ටමින් HS 2007 යටතේ අයිතමයන් 1202කින් සමන්විත ශ්‍රී ලංකාවේ සෘණාත්මක අයිතම ලැයිස්තුව සඳහා 2014 නොවැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. ක්‍රියාත්මක කළ යුතුව ඇති නියමයන් සඳහා වන කාල රාමුව සඳහා එකඟතාව ලබාගැනීමට නියමිත අතර ඒ පිළිබඳව සාමාජික රටවල් විසින්, 2015 වර්ෂයේ පළමු භාගය තුළදී පැවැත්වීමට නියමිත 20 වැනි තාක්ෂණික සාකච්ඡා සම්මුති කමිටුවේදී (TNC) සාකච්ඡා අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 7.0 වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන

## 7.1 විදේශ වාණිජ නියෝජනය

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල 23ක නිලධාරින් 25 දෙනෙකුගෙන් සමන්විත වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධාණය යොමු කරමින් සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරිම සහ ආරක්ෂා කිරීමෙහිලා නිරතවන ලදී. "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන" යටතේ වාණිජ නිලධාරින් විසින් ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් ක්‍රියාවට නංවනු ලැබේ. ශ්‍රී ලාංකික අපනයන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරිම සඳහා, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී. නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වාණිජ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත ඔවුනගේ නිෂ්පාදන වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.

විදේශයන්හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා අපනයන අවස්ථාවන් හඳුනාගැනීම සඳහා වෙළඳපළ සමීක්ෂණ/ තොරතුරු සම්පාදනය කිරීම.
- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම. මෙය, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.
- සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.

- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු/ කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම/ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය.

2010 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද මෙවැනි ආකාරයේ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

**(වගු අංක 03)**

| ක්‍රියාකාරකම් | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | | එකතුව (2010-2014) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා සත්කාරක රට වෙත ශ්‍රී ලංකාවෙන් සහභාගීත්වය | 52 | 510 | 59 | 671 | 80 | 728 | 75 | 848 | 61 | 737 | 327 | 3,494 |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා ශ්‍රී ලංකාව වෙත සත්කාරක රටෙහි සහභාගීත්වය | 12 | 47 | 26 | 90 | 29 | 122 | 37 | 325 | 22 | 169 | 126 | 753 |
| ශ්‍රී ලංකාවේ එක්ස්පෝ - 2012 සඳහා සහභාගිවූවන් | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | 01 | 1160 | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | 1 | 1,160 |
| සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම | 88 | අදාල නොවේ | 116 | අදාල නොවේ | 138 | අදාල නොවේ | 127 | අදාල නොවේ | 33 | අදාල නොවේ | 502 | අදාල නොවේ |
| ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීම (එක්ස්පෝ- 2012 සඳහා හැර) | 49 | 385 | 43 | 282 | 48 | 457 | 98 | 563 | 35 | 387 | 273 | 2,074 |
| සත්කාරක රට වෙත සංචාරය කළ දූත පිරිස් | 41 | 437 | 61 | 436 | 54 | 455 | 70 | 600 | 78 | 805 | 304 | 2,733 |
| සත්කාරක රට වෙත පුද්ගල සංචාරයන් | අදාල නොවේ | 147 | අදාල නොවේ | 174 | අදාල නොවේ | 181 | අදාල නොවේ | 201 | අදාල නොවේ | 280 | අදාල නොවේ | 983 |
| ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් | අදාල නොවේ | 147 | අදාල නොවේ | 139 | අදාල නොවේ | 194 | අදාල නොවේ | 270 | අදාල නොවේ | 237 | අදාල නොවේ | 987 |
| ද්වි මාර්ගික වෙළඳ විමර්ශන පිළිතුරු ලබාදීම | 1,728 | | 1,751 | | 1,882 | | 2,133 | | 2,132 | | 9,626 | |

**7.2 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය - 2014 සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටිය**

වාණිජ දෙපාර්තමේන්තුව විසින්, කුලියාපිටියේදී පවත්වන ලද "දැයට කිරුළ 2014" ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ලදී. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් සහ සේවාවන් පිළිබඳව මහජනතාව, සිසුන් සහ අපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටියේදී තොරතුරු ඇතුළත් පොත් පිංචක් බෙදාදෙන ලද අතර විදේශ රටවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය වීමට ඒ සඳහා උනන්දුවක් දක්වන ව්‍යාපාරකයින්ගේ යහපත උදෙසා වීඩියෝ විද්‍යුත් මාධ්‍ය සාකච්ඡා පහසුකම් සලසා දෙන ලදී.

**7.3 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

**ශ්‍රී ලංකාව සඳහා අවශ්‍යතා සහ ප්‍රමුඛතා සම්බන්ධයෙන් ලෝක වෙළඳ සංවිධානයේ (WTO) වෙළඳාම් පහසුකරණ ස්වයං - තක්සේරුව පිළිබඳ සම්මන්ත්‍රණයක් 2014 මාර්තු මාසයේදී කොළඹදී පවත්වන ලදී**

වෙළඳාම් පහසුකරණය පිළිබඳ ගිවිසුමේ නියමයන් මත පදනම්ව විශේෂ මාර්ගෝපදේශකයක් භාවිත කරමින් මෙම සම්මන්ත්‍රණය පවත්වන ලද අතර ජාත්‍යන්තර විශේෂඥයන් විසින් මේ සඳහා පහසුකම් සලසාලන ලදී. මෙම සම්මන්ත්‍රණයේ ප්‍රතිඵලය වූයේ, විශේෂ හා ආන්තර පිළියම් විධිවිධානයන්ගෙන් (differential treatment provisions) සහ තාක්ෂණික සහායෙන් ප්‍රතිලාභ ලබාගැනීම සහ එකී ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී සහාය දැක්වීමයි. තවද, ජාතික වෙළඳාම් පහසුකරණ කමිටුවක් පිහිටුවීම සඳහා පියවර ගැනීම සඳහා සහභාගිවූවන් විසින් වඩා ඵලදායී නිවේදන ක්‍රියාවලියක් සකස් කිරීම මෙහිදී සිදුකරන ලදී.

**7.4 සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම**

සංචාරක ව්‍යාපාරය, රටෙහි පැවති ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව ක්ෂණික අවධානයට ලක්වූ ක්ෂේත්‍ර වලින් එකක් විය. වෙළඳ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රය තුළ පවත්නා සුවිශාල ශක්‍යතාවන් හඳුනාගනිමින්, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ (Sri Lankan Airlines) සහාය ඇතිව විදේශ රටවල් තුළ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලැබ ඇත. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය කිරීම, සංචාරක කණ්ඩායම්වල සංචාරයන් සංවිධානය කිරීම, ශ්‍රී ලංකා ප්‍රවර්ධන අංගයන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් වෙත සහභාගීවීම , ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් සහ FAM සංචාරයන් සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන මණ්ඩල ස්ථාපිත කිරීම සහ සත්කාරක රටෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රසිද්ධියක් ලබාදීම, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ නිලධාරීන් විසින් අනුගමනය කරන ලද ප්‍රධාන ක්‍රමෝපායන්ට ඇතුළත් වේ.

**7.5 සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය (FDI)**

ශ්‍රී ලංකාව වෙත සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීමෙහිලා, විදේශ රටවල සේවයෙහි යොදවා ඇති වෙළඳ නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකිරීම අඛණ්ඩව සිදුකරන ලදී. වෙළඳ නිලධාරීන් විසින් සමාලෝචනයට බඳුන් කරන ලද කාල පරිච්ඡේදය තුළ, ඔවුන්ගේ අදාළ වෙළඳපළ තුළ විභවතාවෙන් යුතු ආයෝජකයින් ලෙස හඳුනාගත් විදේශ සමාගම් සහ පුද්ගලයින් 100කට අධික සංඛ්‍යාවක් හමුවන ලද අතර රටෙහි පවත්නා ආයෝජන අවස්ථාවන් පිළිබඳව ඔවුන්

වෙත විස්තර සපයාදෙන ලදී. කර්මාන්තශාලා පිහිටුවීමට ඇති ශක්‍යතාවන් අධ්‍යයනය කිරීම සඳහා මෙම පාර්ශ්වයන්ගෙන් කිහිපදෙනෙකු දැනටමත් ශ්‍රී ලංකාව වෙත පැමිණ ඇත.

**7.6 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම**

ශ්‍රී ලංකාව වෙත පැමිණීම සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල දීමට, විදේශීය සමාගම්වල සහ වෙනත් වෙළඳ සහ වාණිජ ව්‍යාපාරවල සම්බන්ධීකරණ කාර්යාලවල/ ශාඛා කාර්යාලවල සේවයේ නියුතු විගමණිකයන් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත්කිරීමේ බලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත. එවැනි සේවා නියුක්තියක් මගින් අපනයන වෙළඳාම, තාක්ෂණික මාරුව සහ ඵලදායිතා වර්ධනය සඳහා ඇතිවන ඍජු ප්‍රතිලාභ සහ එමගින් ජාතික ආර්ථිකයට ඇතිවිය හැකි වාසි සැළකිල්ලට ගනිමින්, එවැනි වීසා බලපත්‍ර නිර්දේශ සඳහා ඉදිරිපත්වන අයදුම්පත් දැඩි ලෙස තක්සේරු කරනු ලැබේ.

වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉන්දියානු ජාතිකයින් 40ක්, බ්‍රිතාන්‍ය ජාතිකයින් 37ක්, ජපන් ජාතිකයින් 15ක්, පාකිස්ථාන ජාතිකයින් 11ක් යනාදී වශයෙන් විවිධ ජාතීන්ගෙන් සහ චීන, කොරියානු, ස්වීඩන්, රුමේනියානු, ඕස්ට්‍රේලියානු සහ අයර්ලන්ත යනාදී අනෙකුත් ජාතීන්ගෙන් අයදුම්කරුවන් 89 දෙනෙකුගෙන් සහ යැපෙන්නන් 56 දෙනෙකුගෙන් සමන්විත විගමණිකයන් 145 දෙනෙකු සඳහා නේවාසික වීසා බලපත්‍ර නිර්දේශ නිකුත් කරනු ලැබ ඇත.

**7.7 1949 අංක 06 දරන උකස් පනත යටතේ ණයදෙන ආයතන අනුමත කිරීම**

1949 අංක 06 දරන උකස් පනත යටතේ, ඕනෑම සමාගමක්, වෙළඳ සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ ගරු. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.

1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ පවරන ලද බලතල ප්‍රකාරව, ගරු. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින්, 2014 ජනවාරි 13 සිට 2017 ජනවාරි 12 දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර 03ක කාලයක් සඳහා ඉහත සඳහන් පනතේ කාර්යය සඳහා පිහිටුවා ඇති මණ්ඩලයේ සභාපති වශයෙන් ආර්. සේමසිංහ මහතා සහ අනුර වී. මැද්දගොඩ මහතා සහ වී. එම්. වීරසිංහ මහතා අනෙකුත් සාමාජිකයන් වශයෙනුත් පත් කරනු ලැබ ඇත.

මෙම මණ්ඩලය විසින්, සමාලෝචන කාල පරිච්ඡේදය තුළදී ඉදිරිපත්වූ අයදුම්පත් 18න් 11ක් නිර්දේශ කරන ලද අතර ඒ අනුව, අයදුම්පත් 10ක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇත. (එනම්, HDFC බැංකුව විසින්, නිර්දේශ ලබාගැනීමෙන් අනතුරුව එහි අයදුම්පත අවලංගු කරගන්නා ලදී)

<u>අනුමැතිය සඳහා ලද අයදුම්පත්</u>

1. CDB
2. TKS ෆිනැන්ස් ලිමිටඩ්
3. කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනැන්ස්
4. වැලිබල් ෆිනැන්ස්

5. ලංකා ඔරික්ස් ෆිනෑන්ස්
6. LOLC මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
7. සම්පත් ලීසින් ඇන්ඩ් ෆැක්ටරින් ලිමිටඩ් – අනුමැතිය ලබාදී ඇත.
8. ශ්‍රී ලංකා HDFC බැංකුව – අනුමැතිය ලබාදී ඇත.
9. GAGANA කෝඩිනේෂන් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
10. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් ලිමිටඩ්
11. ග්ලෝබල් ට්‍රස්ට් ෆයිනෑන්සියල් සර්විසස් ලිමිටඩ්
12. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් Co ලිමිටඩ්
13. පීපල්ස් ම’චන්ට් ෆිනෑන්ස්
14. නේෂන් ලංකා ෆිනෑන්ස්
15. ETI ෆිනෑන්ස් ලිමිටඩ්
16. පීපල්ස් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්
17. කැපිටල් ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
18. ම’කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස්

<u>නිර්දේශිත සහ ගැසට් කරන ලද අයදුම්පත්</u>

1. කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස්
2. වැලිබල් ෆිනෑන්ස්
3. ලංකා ඔරික්ස් ෆිනෑන්ස්
4. LOLC මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
5. සම්පත් ලීසින් ඇන්ඩ් ෆැක්ටරින් ලිමිටඩ්

2014.06.17 දින නිර්දේශ කරන ලදී.
(2014.06.17 දින ගැසට් කරන ලදී)

6. පීපල්ස් ම’චන්ට් ෆයිනෑන්ස්
7. CDB
8. TKS ෆිනෑන්ස් ලිමිටඩ්
9. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් Co ලිමිටඩ්
10. ම’කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස්

2014.11.05 දින නිර්දේශ කරන ලදී.
(2014.12.10 දින ගැසට් කරන ලදී)

## 8.0 ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම

පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික සම්භවීය නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත්කරනු ලබයි.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

- පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

සාමාන්‍ය වැඩකරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 500 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදුව නිකුත් කරනු ලැබ ඇත. 2010 සිට 2014 දක්වා කාලය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාළ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව වගු අංක 04 මගින් පෙන්නුම් කෙරේ. පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් 30 - 50 දෙනෙකුට දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබාගැනීම යනු අවශ්‍යවන ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ;

(අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම,
(ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම,
(ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම,
(ඈ) වරණය ලබාදෙන්නාවූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ
(ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

**<u>වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික</u>**

**(වගු අංක 04)**

| ගිවිසුම | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
| යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය | 88,409 | 85,600 | 114,029 | 79,774 | 83,898 |
| වරණීය පොදු ක්‍රමය - අනෙකුත් රටවල් | 15,434 | 14,782 | 13,909 | 13,410 | 12,706 |
| වරණීය පොදු ක්‍රමය - පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් | 871 | 856 | 1,009 | 929 | 842 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 10,373 | 35 | 9,742 | 11,088 | 10,852 |
| පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 5,219 | 30 | 8,057 | 8,190 | 7,069 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුම | 1,906 | 2,424 | 2,781 | 3,482 | 4,131 |
| දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම | - | - | 26 | 74 | 388 |
| දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම | 239 | 248 | 253 | 243 | 309 |
| ගෝලීය වෙළඳ වරණ ක්‍රමය | 99 | 115 | 136 | 147 | 107 |
| **එකතුව** | **122,550** | **104,090** | **149,942** | **117,337** | **120,302** |

## වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංචලන - 2014

| නිලධාරියාගේ නම | රට/ නගරය | දිනය |
|---|---|---|
| **සේවා ස්ථාන මාරුවීම් - ආපසු පැමිණීම්** | | |
| එල්. ජී. දිසානායක මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ස්ටොක්හොල්ම් (Stockholm) | 03.02.2014 |
| ඊ. ටී. එම්. සී. එස්. අබේරත්න මහත්මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | මොස්කව් | 31.03.2014 |
| ජේ. ඒ. වයි. ජී. ජයසූරිය මෙනවිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | පැරිස් | 06.05.2014 |
| ආර්. ජී. එස්. පී. කේ. විජේසේකර මහතා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | චෙන්නායි | 01.07.2014 |
| යූ. සමරතුංග මෙනවිය<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | මුම්බායි | 07.07.2014 |
| කේ. ඩී. එන්. කොඩිකාර මහත්මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ප්‍රිටෝරියා (Pretoria) | 31.12.2014 |
| ගෝතමී ආර්. සිල්වා මහත්මිය<br>අධ්‍යක්ෂ | රෝමය | 15.03.2014 |
| බී.ජී.පී. ජයකොඩි මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | කයිරෝ | 13.07.2014 |
| වයි. වයි. කේ. ද සිල්වා මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | සෝල් (Soul) | 30.06.2014 |
| **සේවා ස්ථාන මාරුවීම් - පත්කිරීම්** | | |
| ගෝතමී ආර්. සිල්වා මහත්මිය<br>අධ්‍යක්ෂ | බ්‍රසල්ස් | 17.03.2014 |
| ඩී. ඩබ්ලිව්. ජිනදාස මහතා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | රෝමය | 05.04.2014 |
| වී. එස්. බණ්ඩාර මහත්මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | මුම්බායි | 25.10.2014 |
| ආර්. මල්ලිකාරච්චි මහත්මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | සිංගප්පූරුව | 08.08.2014 |
| පී. ඒ. එස්. පොන්නම්පෙරුම මහතා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | නව දිල්ලිය | 18.11.2014 |

| | | |
|---|---|---|
| පී. කේ. එස්. පට්ටිවිල මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ක්වාලා ලම්පූර් | 20.04.2014 |
| බී. ජී. පී. ජයකොඩි මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | බ්‍රසීලය | 14.07.2014 |
| ඩබ්ලිව්. පී. ඒ. එෆ්. ගුණසේකර මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | පැරිස් | 20.04.2014 |
| සී.කේ. කිරිවන්දල මෙනවිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | මොස්කව් | 13.05.2014 |
| එම්. එම්. ටී. ඕ. මුල්ලෙගම්ගොඩ මහත්මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ස්ටොක්හොල්ම් (Stockholm) | 28.03.2014 |

# ANNUAL ACCOUNTS Page: 1

**ශීර්ෂ අංකය /Head No:295**

**අමාත්‍යංශයවාණිජ දෙපාර්තමේන්තුව -:දෙපාර්තමේන්තුව/**
**Ministry/Department:-Department of Commerce**

**වැඩසටහන් අංකය / Programme No:01**

**ව්‍යාපෘතිය / 1Project 1**

**පුනරාවර්තන වියදම් /Recurrent Expenditure**

| විස්තරය<br>**Description** | **2013 සත්‍ය වියදම**<br>**Actual Exp.**<br>**Rs.** | **2014 අනුමත ඇස්තමේන්තුව**<br>**Estimate**<br>**Rs.** | **2014 සංශෝධිත ඇස්තමේන්තුව**<br>**Revised Estimate**<br>**Rs.** | **2014 සත්‍ය වියදම**<br>**Actual Exp.**<br>**Rs.** | **ඉතිරිය**<br>**Savings**<br>**Rs.** |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි<br>Personal Emoluments | 31,015,639 | 37,600,000 | 34,190,000 | 34,178,906 | 11,094 |
| වෙනත්<br>Other | 61,624,657 | 57,700,000 | 58,060,000 | 57,609,930 | 450,070 |
| මුළු වියදම් පුනරාවර්තන<br>**එකතුව /Total** | **92,640,296** | **95,300,000** | **92,250,000** | **91,788,836** | **461,164** |

# මූලධන වියදම්
# Capital Expenditure

| වැය විෂය අංකය විස්තර / | ('000) සත්‍ය වියදම Actual (2013) | ('000) අනුමත ඇස්තමේන්තු Estimate (2014) | ('000) සංශෝධිත ඇස්තමේන්තු Revised Estimate (2014) | ('000) සත්‍ය වියදම Actual (2014) | ඉතිරිය Savings |
|---|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම** **Rehabilitation & improvement of Capital Assets** | **111** | **500** | **500** | **140** | **360** |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ )2002) Plant Machinery & Equipment | 20 | 200 | 200 | 43 | 157 |
| වාහන )2003) Vehicles | 91 | 300 | 300 | 97 | 203 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** **Acquisition of Capital Assets** | **4,050** | **2,700** | **4,950** | **4,905** | **45** |
| වාහන )2101) Vehicles | 150 | 0 | 0 | 0 | 0 |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ)2102) Furniture & Office Equipment | 3,665 | 2,500 | 4,750 | 4,707 | 43 |
| යන්ත්‍රෝපකරණ )2103) Machinery | 235 | 200 | 200 | 198 | 2 |
| **හැකියා වර්ධනය** **Capacity Building** | **212** | **2,500** | **3,300** | **3,166** | **134** |
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය)2401) Training & Capacity Building | 212 | 2,500 | 3,300 | 3,166 | 134 |
| **වෙනත්** **Other Capital** | **4,595** | **6,000** | **6,000** | **5,020** | **980** |
| වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් )2502) Trade Promotion Activities | 4,595 | 6,000 | 6,000 | 5,020 | 980 |
| **එකතුව/ Total** | **8,968** | **11,700** | **14,750** | **13,231** | **1,519** |